**වැලිකන්ද ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**-----------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන.

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 17 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජුනි 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද.ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 මැයි 20 දින සරසවි සංහිද කලා උළෙල සඳහා ලැබුණු රු. 200,000 ක පුනරාවර්තන ආදායමක් ප්‍රාග්ධන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) පළාත් සභා විමධ්‍යගත සංවර්ධන වැඩසටහන සඳහා වැය වූ රු. 215,000 ක ප්‍රාග්ධන වියදම සැපයුම් හා උපකරණ යටතේ පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන සඳහා වැය වූ රු. 446,440 ක ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු යටතේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන මාර්ග සතිය සඳහා උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයයෙන් ලැබිය යුතු රු. 1,499,528 ක මුදල ණයගැතියන්ගෙන් සහ ඉන්ධන පිරවුම්හලකට ගෙවිය යුතු රු. 1,257,211 ක මුදල ණයහිමියන්ගෙන් අත්හැරී තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාළව ඉදිරිපත් කළ ලේඛන සහ මූල්‍ය ප්‍රකාශන අතර රු. 248,148 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 10 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම හෙළිදරව් කරමින් තිබෙන දිඹුලාගල ප්‍රාදේශීය සභාවෙන් අයවිය යුතු රු. 32,049 ක සේවක ණය පොලී සහ රු. 1,000,000 ක උසාවි දඩ මුදල් නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) වසර 11 ක කාලයක සිට ගිණුම්වල දක්වා තිබෙන වියදම් ණයහිමි රු. 468,474 ක් නිරවුල් කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-----------------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු. 279,732,485 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළව අයිතිය තහවුරුකිරීමේ ලිපි, සමීක්ෂණ මණ්ඩල වාර්තා, විස්තරාත්මක උපලේඛන හා ආදායම් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.5 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති,රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) | රීති අංක 21 | මුදල් ලැබීමෙන් අනතුරුව මුදල් ගෙවූ තැනැත්තා වෙත ලදුපතක් නිකුත් කළ යුතු වුවත් වැලිකන්ද ජල පිරිපහදු මධ්‍යස්ථානය භාර නිලධාරියා විසින් ජලය නිකුත් කිරීමට අදාලව ලැබෙන මුදල් සඳහා ලදුපත් නිකුත් කර නොතිබුණි. |
| (ii) | රීති අංක 59 සිට 63 දක්වා රීති | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් පිළිබඳ වූ ලැයිස්තු පිළියෙල කර වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | රිති අංක 67 | වාර්ෂිකව සිදුකළ යුතු සමීක්ෂණයක් මඟින් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන්වල ප්‍රමාණයේ අඩුවැඩිවීම් ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කර නොතිබීම නිසා බල ප්‍රදේශයේ ඇති සියළුම වෙළඳ ස්ථාන සහ වෘත්තීය ස්ථානවලින් බලපත්‍ර ගාස්තු අයවන බවට තහවුරු නොවිණි. |
| (iv) | රීති අංක 180 | මුදල්, ආදායම් ආදිය සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පවරනු ලැබ ඇති නිලධාරින්, රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) | රීති අංක 203 | සභාවේ දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පවත්වා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරුමැද පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය<br>-------------------------------------- | |
| | රීති අංක 261.2.2 | රීතියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ලබාගත් රු. 134,000 ක අත්තිකාරම් මුදල් පියවීම මාස 01 සිට මාස 9 ½ දක්වා කාලයක් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. |
| (ඇ) | චක්‍රලේඛ හා ලිපි<br>------------------- | |
| | 2015 දෙසැම්බර් 04 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ එන්සිපී/එල්ජී/ඒසී/04/01/02 අංක දරන ලිපිය | සභාපතිවරයා වෙත වෙන්කර ඇති නිල වාහනය සඳහා 2015 දෙසැම්බර් මස සිට මසකට ලීටර් 150 ක උපරිම ඉන්ධන සීමාවකට යටත්ව ලේකම්වරුන් විසින් භාවිතා කළ හැකි වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී එම රථය සඳහා රු. 346,655 ක් වටිනා ඉන්ධන ලීටර් 3649 ක් වැඩියෙන් වැයකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,135,860 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 1,120,053 ක් විය.

2.2. ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------

ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | ටෙන්ඩර් බදුකුලී | 9,615,000 | 2,825,500 | 525,715 |
| (ii) | බදුකුලී | 1,554,900 | 206,829 | 1,473,404 |
| (iii) | වෙළඳ බලපත්‍ර | 1,075,000 | 421,125 | 654,800 |
| (iv) | උසාවි දඩ | 5,400,000 | 3,902,417 | 4,367,899 |

2.2.2 ටෙන්ඩර් මත බදුකුලී

----------------------

වර්ෂය ආරම්භයේ පැවති හිඟ ටෙන්ඩර් බදුකුලී මුදල වු රු. 525,715 න් කිසිදු මුදලක් වර්ෂය තුළ රැස්කර නොතිබුණි.

2.2.3 බදුකුලී

--------

වර්ෂය ආරම්භයේ පැවති හිඟ බදුකුලී ආදායම් වු රු. 1,394,536 න් වර්ෂය තුළ රැස්කරගෙන තිබුණේ රු. 638,303 ක් හෙවත් සියයට 45 ක් පමණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

වර්ෂය ආරම්භයේ පැවති හිඟ වෙළඳ බලපත්‍ර ආදායම වූ රු. 655,300 න් අයකර තිබුණේ රු. 500 ක් පමණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අදාල තනතුරුවල රාජකාරී පැවරීමකින් තොරව 2016 ජුලි මාසය දක්වා කාර්යාලීය රාජකාරී කටයුතු වල යොදවා සිටි මාර්ග කම්කරුවන් දෙදෙනෙකු සහ වැඩ පරීක්ෂකවරයෙකු 2016 අගෝස්තු සිට මාර්ග කම්කරුවන් දෙදෙනා පුස්තකාලයටත් වැඩ පරීක්ෂකවරයා ක්ෂේත්‍ර රාජකාරී සඳහාත් අනුයුක්ත කර තිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සවිකර තිබුණ විථි පහන් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් සභාව විසින් නඩත්තු නොකරන බැවින් සභාව සතු විථි පහන් සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කර ගැනීමට හෝ අලුත්වැඩියාවන් සිදු කිරීමේදී අලුත්වැඩියා කරනු ලබන්නේ කුමන විථි පහනද යන්න හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට වැඩබලන ආදායම් පරිපාලක ලෙස කටයුතු කරන ප්‍රාථමික මට්ටමට අයත් සෞඛ්‍ය කම්කරු නිලධාරියෙකු රු. 460,660 කට ආසන්න මුදලක් වංචාකර ඇති බවට කරුණු අනාවරණය වී තිබියදීත් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර මෙම තනතුර සඳහා නැවතත් ප්‍රාථමික මට්ටමට අයත් නිලධාරියෙකු 2017 ජනවාරි 31 දින සිට පත්කර තිබුණි

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) ජල බවුසර් දෙකක් හා බැකෝ යන්ත්‍රයක් සේවයේ යෙදවීම මත ලැබෙන ආදායම් හඳුනාගැනීම සඳහා ආදායම් ලේඛන නඩත්තු කර නොතිබුණි.

(ආ) පුද්ගලික ආයතනයකට කොන්ත්‍රාත් මත ලබාදී දැනට ඉදිකරමින් පවතින නව ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියට අවශ්‍ය ජලය ප්‍රාදේශීය සභාවට අයත් ජල බවුසර් මඟින් කිසිදු මුදල් අයකිරීමකින් තොරව ලබාදෙමින් පැවතුණි.

(ඇ) සභාවේ ලේකම්වරිය විසින් භාවිතා කරන කැබ් රථය රාත්‍රී කාලයේදී ප්‍රාදේශීය සභා භූමියේ ගාල් නොකර තමන්කඩුව ප්‍රාදේශීය සභා භූමියේ ගාල්කර තබන බව අනාවරණය වූ නමුත් ඒ පිළිබඳව කිසිදු අවස්ථාවක ධාවන සටහන්වල සඳහන් කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙණු

-----------------------------------

2014 දෙසැම්බර් මාසයේදී දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු ගැල්වනයිස් කොඩිකණු 368 න් රු. 239,142 ක් වටිනා කොඩි කණු 210 ක් අස්ථානගත වී තිබූ නමුත් මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් අදාල අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 අප්‍රේල් හා 2009 පෙබරවාරි මාස වල උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ලබාදුන් රු. 613,500 ක් වටිනා සහල් පිටි සහ සහල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන උපකරණ 2017 මාර්තු 31 දින වන විටත් වර්ෂ 8 කට අධික කාලයක් තිස්සේ භාවිතයට නොගෙන දිරාපත් වෙමින් පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සතු වාහන 03 ක් පිළිවෙලින් මාස 6 සිට අවුරුදු 03 දක්වා කාලයක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් 2009 වර්ෂයේදී ලබාදී තිබුණු නල ළිං උපකරණ පද්ධති 56 ක් වසර 7 කට අධික කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ ගොඩ ගසා තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

2016 ග්‍රාමීය මාර්ග සංවර්ධන සතිය වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද මාර්ග සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර නොතිබුණු අතර සංවර්ධනය කරන ලද මාර්ග වල නම් හා දුර ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් නොකෙරුණි.

3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) 2007 වර්ෂයේදී රු. 750,000 ක් පමණ වැය කරමින් ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැලිකන්ද පොළ භූමිය තුල ඉදිකරන ලද ගොඩනැඟිල්ල වර්ෂ 9 කටත් අධික කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතුණි. දැනට මෙම ගොඩනැඟිල්ලේ කොන්ක්‍රීට් කණු කිහිපයක් හා බිත්ති කොටස් කිහිපයක් පමණක් ඉතිරි වී ඇති බව 2017 මාර්තු 31 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු වෙනුවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සේනපුර ප්‍රදේශයෙන් ලබාදී තිබුණු අක්කර 05 ක පමණ ඉඩමට කසළ බැහැර කරමින් තිබුණි. මෙම ඉඩම වැලිකන්ද නගරයට යාබද මඩකලපු ප්‍රධාන මාර්ගයට ආසන්නව පවතින බැවින් අවිධිමත් ලෙස කසල බැහැර කිරීම තුළ අනාගතයේදී පාරිසරික ගැටළු උද්ගත වියහැකි බව නිරීක්ෂණය විය.

3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 අගෝස්තු 01 දින සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුරට නිත්‍ය නිලධාරියෙකු පත් කර නොතිබුණු අතර 2016 මැයි 19 දක්වා රාජකාරි ඉටු කිරීම සඳහා විමර්ශන නිලධාරියෙකුද 2016 මැයි 20 දින සිට රාජකාරි ඉටු කිරීම සඳහා කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ නිලධාරිනියකද පත්කර තිබුණි.

(ආ) 2011 නොවැම්බර් 01 දින සිට අනියම් පදනම මත කාර්මික සහායිකාවක් ලෙස බඳවාගත් 2014 ඔක්තෝබර් 24 දින සිට මාර්ග කම්කරු තනතුරේ ස්ථිර කළ නිලධාරිනියක් වසර 05 කට අධික කාලයක් තිස්සේ කාර්මික නිලධාරි තනතුරේ වැඩ බලමින් තිබූ අතර කාර්යාල කාර්ය සහායකයකු සහ සෞඛ්‍ය කම්කරුවෙකු ආදායම් පරිපාලක තනතුරු වල යොදවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත තනතුරු 10 ක පුරප්පාඩු හා තනතුරු 13 ක අතිරික්තයක් පවැති බව නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලන**

**-----------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) නිලධාරීන් වෙත රාජකාරී බලතල පැවරීම

(ඇ) ණයගැති/ණයහිමි පාලනය

(ඈ) ගබඩා පාලනය

(ඉ) අභ්‍යන්තර විගණනය

(ඊ) වාහන පාලනය